2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය - 208

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

(01). ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය:

1.1. හැඳින්වීම:

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්යය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වූ කාර්යය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවය ද සැලකීමට භාජනය කරනු ලැබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොට ම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වූ කොළඹ ජාතික කෞතුකාගාරය මඟිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය, නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, හම්බන්තොට මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය හා පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්යය භාරය වේ. එසේම ජංගම කෞතුකාගාර ප්‍රදර්ශන සහ දේශන හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර:

(අ). ආයතනයේ දැක්ම:

දැනුම සහ ආස්වාදයෙන් පරිපූර්ණ අර්ථවත් කෞතුකාගාර සේවාවක් මහජනතාව වෙත ලබා දීම.

(ආ). ආයතනයේ මෙහෙවර:

සංස්කෘතික සහ ස්වභාවික උරුමය පිළිබිඹු කෙරෙන කෞතුක භාණ්ඩ සහ නිදර්ශක අත්පත් කරගැනීම, එක්රැස් කිරීම, විධිමත්ව ලේඛණගත කිරීම, විද්‍යාත්මකව සංරක්ෂණය කිරීම සහ එම එකතුන් සහ දැනුම පර්යේෂණ, අධ්‍යයන, අධ්‍යාපන අරමුණු සහ රසාස්වාදය උදෙසා ඵලදායී ලෙසත් ආකර්ශනීය ලෙසත් මහජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීම.

1.3. කාර්යභාරය

- පුරාවිද්‍යාව, මානව වංශ විද්‍යාව, මානව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව සහ භූ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ කෞතුක භාණ්ඩ සහ නිදර්ශක රැස් කිරීම, ලේඛනගත කිරීම සහ
- ආරක්ෂා කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කොළඹ ජාතික කෞතුකාගාරය ඇතුළු කෞතුකාගාර එකොළහක ස්ථීර ප්‍රදර්ශන යාවත්කාලීනව පවත්වා ගැනීම, ආරක්ෂාව තහවුරු කිරීම සහ දෛනික නඩත්තු සහ පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම.
- සංරක්ෂිත පැරණි ග්‍රන්ථ සහ පුස්කොළපොත් එකතුවක් සහිත ජාතික කෞතුකාගාර පුස්තකාලය මගින් පර්යේෂකයන් සඳහා ඵලදායී විමර්ශන සේවාවක් ලබාදීම.
- උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රකාශයට පත්කිරීම.
- ස්පෝලියා සෙලනිකා නැමති පර්යේෂණ සංග්‍රහය, කෞතුකාගාර එකතුන්ට අදාළ පර්යේෂණ සහ නාමාවලි, දෙපාර්තමේන්තු ප්‍රකාශන ලෙස මුද්‍රණය වී තිබෙන විරල ග්‍රන්ථ නැවත මුද්‍රණය කිරීම.
- උක්ත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව දැනුම වර්ධනය කිරීම සඳහා දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ප්‍රදර්ශන සහිත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතනවල විද්‍යාර්ථීන් සඳහා කෞතුකාගාර විද්‍යාව පිළිබඳ දැනුම ලබාදීම සඳහා සම්පත් දායක ආයතනය ලෙස කටයුතු කිරීම.
- නීතිමය කටයුතු සඳහා සත්ත්ව ආදර්ශක හඳුනාගැනීමට අදාළ වාර්තා ඉදිරිපත් කිරීම.
- බාහිර ආයතන විසින් කෞතුකාගාර ස්ථාපනය කිරීමේදී උපදේශන සේවා ලබාදීම.
- ආකර්ෂණීය කෞතුකාගාර සේවාවක් ලබාදීම තුළින් දෙස් විදෙස් කෞතුකාගාර නරඹන්නන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කිරීම සහ එමඟින් ජාතික ආදායමට දායකත්වයක් ලබාදීම.

1.4. සංවිධාන සටහන: (ඇමුණුම: 01 බලන්න)

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර:

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ හා කෞතුකාගාර පිළිබඳ තොරතුරු පහත පරිදි දැක්විය හැකිය.

(අ). දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ:

- මානවවංශ විද්‍යා අංශය
- මානව විද්‍යා අංශය

- සත්ත්ව විද්‍යා අංශය
- කීට විද්‍යා අංශය
- භූ විද්‍යා අංශය
- උද්භිද විද්‍යා අංශය
- ජාතික කෞතුකාගාර පුස්තකාලය
- අධ්‍යාපන හා ප්‍රකාශන අංශය
- සංරක්ෂණ අංශය
- පාලන අංශය
- ගිණුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය
- ඡායාරූප අංශය
- ප්‍රදර්ශන සැලසුම් අංශය
- තොරතුරු තාක්ෂණ අංශය

(ආ). දෙපාර්තමේන්තුවේ යටතේ පාලනය වන කෞතුකාගාර:

- කොළඹ ජාතික කෞතුකාගාරය
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය - කොළඹ
- මහනුවර ජාතික කෞතුකාගාරය
- රත්නපුර ජාතික කෞතුකාගාරය
- ගාල්ල ජාතික කෞතුකාගාරය
- ඕලන්ද කෞතුකාගාරය - පිටකොටුව
- ජන කෞතුකාගාරය - අනුරාධපුරය
- සමුද්‍ර කෞතුකාගාරය - ගාල්ල
- නිදහස් අනුස්මරණ කෞතුකාගාරය - කොළඹ
- මාගම්පුර රුහුණු උරුම කෞතුකාගාරය - හම්බන්තොට
- පුරාණ තාක්ෂණ කෞතුකාගාරය - පොළොන්නරුව

(02). ප්‍රගතිය හා ඉදිරි දැක්ම:

ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක:

(අ). ජයග්‍රහණ:

- 2025 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත වාර්ෂික ආදායම වූයේ රු. මිලියන 150 කි. එහෙත් මේ වසරේදී දෙපාර්තමේන්තුව විසින් ලබාගත් වාර්ෂික

ආදායම රු. මිලියන 148.5 කි. ඒ අනුව අපේක්ෂිත ආදායමට සමීප ආදායමක් ලබා ගැනීමට හැකිවීම අප ලැබූ ජයග්‍රහණයක් සේ සැලකිය හැකිය.

- අනුරාධපුර ජන කෞතුකාගාරයේ ප්‍රදර්ශනය සඳහා බිත්ති අල්මාරි සැකසීම
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ යටිතල පහසුකම් නවීකරණය, මැදිරි නවීකරණය සහ නිදර්ශක සංරක්ෂණය සහ මැදිරි වායු සමීකරණ කටයුතු සිදු කිරීම
- රත්නපුර ජාතික කෞතුකාගාරයේ පෞරාණික ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියාව සහ දේශන ශාලාව නවීකරණ කටයුතු සිදු කිරීම
- ඕලන්ද කෞතුකාගාරයේ ප්‍රදර්ශන මැදිරි නවීකරණය සහ ඕලන්ද කෞතුකාගාරයේ තරප්පු පෙළට වැසි ආවරණ දැමීම, සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම
- ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ වැසිකිලි හා නානකාමර සහිත ප්‍රදේශ නවීකරණය කිරීමට
- පොළොන්නරුව කෞතුකාගාරයේ පහසුකම් වැඩි දියුණු කිරීම
- කොළඹ ජාතික කෞතුකාගාරයේ මහනුවර මැදිරිය ප්‍රතිසංවිධානය කිරීම
- කොළඹ ජාතික කෞතුකාගාරයේ බටහිර නැගෙනහිර බිත්ති හා ශ්‍රවනාගාර ගොඩනැගිල්ලේ පිටත් බිත්ති වල තීන්ත ආලේපනය කිරීම, මැදිරි වායු සමීකරණය කිරීම හා ගෘහ භාණ්ඩ මැදිරියේ දොර සකස් කිරීම
- අනුරාධපුර කෞතුකාගාරයේ කාමර සහිත ගොඩනැගිල්ල නවීකරණය කිරීම
- Museum Arcade ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම
- මහනුවර කෞතුකාගාරයේ ප්‍රවේශ පත්‍ර මිල දී ගන්නා ස්ථානයේ ගොඩනැගිල්ලෙහි අගුව දික් කර සැකසීම
- නැඳුන්ගමුව හස්තිරාජයා තැන්පත් කරන ප්‍රදර්ශන මැදිරිය වායුසමීකරණය කිරීම හා අනෙකුත් කටයුතු සිදු කිරීම
- ගාල්ල ජාතික කෞතුකාගාරයේ මැදිරි නවීකරණය සිදු කිරීම
- පොළොන්නරුව කෞතුකාගාරය උද්‍යාන අලංකරණ කටයුතු සිදු කිරීම
- අනුරාධපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශන නවීකරණය සිදු කිරීම
- ශ්‍රවණාගාරයේ කෑම ශාලාව සඳහා අභ්‍යන්තර අළුත්වැඩියාවක් සිදු කිරීම
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරය සඳහා නාම පුවරුවක් සවි කිරීම
- නෙලුම් පොකුණ මාවතට මුහුණලා පිහිටි කෞතුකාගාර ගේට්ටුව සඳහා නාම පුවරුවක් සවි කිරීම
- ලෝටස් මැදිරිය අළුත්වැඩියා කටයුතු සිදු කිරීම
- සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයට මායිම්ව පිහිටි කොළඹ ජාතික කෞතුකාගාරයේ පෞරාණික තාප්පයට යාබදව පිහිටි දැල්වැට නැවත ස්ථාපිත කිරීම
- පහත සඳහන් නව කෞතුකාගාර ප්‍රකාශන මුද්‍රණය කිරීම
    - කොළඹ ජාතික කෞතුකාගාර මාර්ගෝපදේශ සංග්‍රහය
    - Zpolia Zeylanica Vol. 51
    - කොළඹ ජාතික කෞතුකාගාරයේ ගෘහ භාණ්ඩ මැදිරිය අත්පත්‍රිකාව
- පහත සඳහන් කෞතුකාගාර ප්‍රකාශන නැවත මුද්‍රණය කිරීම

- ශ්‍රී ලංකාවේ මිල මුදල්
- ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික කෘෂිකර්මය
- A Guide to the National Nuseum Colombo

(ආ). අභියෝග හා ඉදිරි ඉලක්කඃ

- 2026 වසර සඳහා රු.මිලියන 175 ක වාර්ෂික ආදායමක් ලබාගැනීමට කටයුතු කිරීම
- නඳුන්ගමුව විජයරාජා හස්තියාගේ අනුරුව මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීම
- කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශිත ත්‍රෛයිභාෂා ශිලා ලිපිය යුනෙස්කෝ ලෝක මතක උරුම ලේඛනයට ඇතුළත් කරවීම
- ජාතික කෞතුකාගාරයේ නව වෙබ් අඩවිය එළිදැක්වීම
- ජාතික කෞතුකාගාර පුස්තකාලයේ නව පුස්තකාල මාදුකාංගය (koha) පාඨක භාවිතය සඳහා හඳුන්වාදීම
- ජාතික කෞතුකාගාරයේ 150 වන සමරුව නිමිත්තෙන් විශේෂ සමරු ප්‍රකාශනයක් සකස් කිරීම
- ජාතික කෞතුකාගාරයේ 150 වන සමරුව නිමිත්තෙන් විශේෂ සමරු මුද්දරයක් නිකුත් කිරීම
- අනුරාධපුර ජන කෞතුකාගාරය සඳහා නව මාර්ගෝපදේශ ග්‍රන්ථයක් මුද්‍රණය
- අනුරාධපුර ජන කෞතුකාගාරය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීම
- Zpolia Zeylanica Vol. 52 පර්යේෂණ සංග්‍රහය මුද්‍රණය කිරීම
- පහත සඳහන් ග්‍රන්ථ නැවත මුද්‍රණය
    - වෛද්‍යක සාරාර්ථ සංග්‍රහය
    - ශ්‍රී ලංකාවේ කෝලම් සම්ප්‍රදාය

.....

සනූජා කස්තුරිආරච්චි

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ජනරාල්

සනූජා කස්තුරිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ 07

3.5. මූල්‍ය ප්‍රකාශ සටහන් :

ඒසිඒ-එල්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025		සටහන	කළඹ 2025	2024	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		403,402,750	458,548,026	ඒසිඒ-3
-	නැන්පතු		7,272,584	13,989,343	ඒසිඒ-4
11,000,000	අත්තිකාරම් ගිණුම්		17,900,375	15,452,219	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
11,000,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**428,575,709**	**487,989,588**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**428,575,709**	**487,989,588**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**519,274**		
11,000,000	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)**		**428,056,435**	**487,989,588**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
305,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	299,234,936	223,535,546	
123,707,630	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	88,679,871	99,061,592	ඒසිඒ-2(ii)
1,492,370	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,067,008	1,092,103.75	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
431,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**388,981,815**	**323,689,243**	
	මූලධන වියදම්				
210,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	185,183,510	122,651,922	
63,663,260	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	50,543,192	197,756,062	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	497,894	498,434	
75,000,000	වෙනත් මූලධන වියදම්	15	70,964,614	13,612,497	
349,163,260	**මුළු මූලධන වියදම් (උ)**		**307,189,209**	**334,518,915**	
	නැන්පතු ගෙවීම්		35,649,723	6,772,773	ඒසිඒ-4
25,000,000	අත්තිකාරම් ගෙවීම්		25,933,361	21,801,428	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
25,000,000	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**61,583,083**	**28,574,201**	
805,163,260	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**757,754,107**	**686,782,358**	
(794,163,260)	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(329,697,673)**	**(198,792,770)**	
	නොපිය වූ අග්‍රිම ශේෂය		-	687,338	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(329,697,673)	(202,355,526)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	2,875,418	ඒසිඒ-3
			(329,697,673)	**(198,792,770)**	

1

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	28,896,166,421	15,731,295,275
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	61,383,231	53,350,245
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**28,957,549,652**	**15,784,645,520**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		38,697,091	2,286,967
දේපළ පිරියත හා උපකරණ සංචිතය		28,896,166,421	15,731,295,275
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	22,686,139	51,063,278
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**28,957,549,652**	**15,784,645,520**

පිටු අංක 01 සිට 43 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 44 සිට 72 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත්

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය : 2026.02.19	දිනය : 2026/02/17
ප්‍රින්ස් සේනාධීර ලේකම් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.	සනූජා කස්තුරිආරච්චි අධ්‍යක්ෂ ජනරාල් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ 07	එන්.ඒ.පී.එස්. වීරරත්න ප්‍රධාන ගණකාධිකාරි ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කොළඹ 07

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2025 රු.	2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	202,079,547	146,710,387
අග්‍රිම ලැබීම්	403,402,750	458,548,026
අත්තිකාරම් අයකර ගැනීම්	17,245,701	15,221,808
තැන්පතු ලැබීම්	7,272,584	13,989,343
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	630,000,581	634,469,564
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	387,003,732	321,517,513
සහනාධාර සහ මාරුකිරීම්	1,067,008	1,092,104
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	140,356,061	38,402,843
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	1,694,719	48,125,400
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	519,274	2,875,418
අත්තිකාරම් ගෙවීම්	26,137,891	21,804,778
තැන්පතු ගෙවීම්	35,649,723	6,772,773
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	592,428,407	440,590,829
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	37,572,174	193,878,735
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම් , මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	38,259,512	193,191,397
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූළු මුදල් ප්‍රවාහය (ඉ)	38,259,512	193,191,397
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(38,259,512)	(193,191,397)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(687,338)	687,338
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(687,338)	687,338
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	687,338	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.6. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2003.99.00	විකුණුම් සහ ගාස්තු අනිකුත් ලැබීම්	150,000	150,000	153,965	102.64%
2002.01.01	රජයේ ගොඩනැගිලි කුලී	2,490	2,490	3,973.38	159.57%

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	431,000,000	431,000,000	388,981,915	90%
ප්‍රාග්ධන	349,000,000	349,163,260	307,189,209	88%

3.8. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන,ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.9. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය ٪ ලෙස වාර්තා කිරීම
9151	ගොඩකැඟිලි හා ව්‍යූහයන්	–	2,113,551,125	-	-
9152	යන්ත්‍රෝපකරණ	–	3,205,333,143.69	-	-
9153	ඉඩම්	–	23,544,305,389.92	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	–	6,464,603.03	-	-
9160	කෙරෙමින් පවතින වැඩ	–	26,512,159.48	-	-

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

** පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දී විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය

3.10. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAA/B/NM/246/2025/FA මඹේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2026 ජූනි 23 දින

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
02 JUL 2026

ගණන්දීමේ නිලධාරී,

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 208 ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

උක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශවල පිටපතක් මේ සමඟ එවමි.

කේ.එච්.යූ.ඩී. සෝත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත්:- 1. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - (විගණිත මූල්‍ය ප්‍රකාශනවල මුල් පිටපත හා සම්පිණ්ඩන වාර්තාවේ පිටපතක් මේ සමඟ එවමි.)

2. ලේකම්, බුද්ධශාසන , ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAA/B/NM/246/2025/FA

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2026 ජූනි 22 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුද්‍රල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුද්‍රල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට

ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇති ACA -6 ආකෘතියෙහි මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.38,259,512ක් ලෙස දක්වා තිබුනද 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශනයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු.50,543,192ක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් රු.12,283,680ක වෙනසක් නිරීක්ෂණය විය. එම වටිනාකම මු.රෙ 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් ලෙස දක්වා තිබූ අතර වෙනත් ආයතන විසින් කුමක් සඳහා වියදම් දැරුවේද හා එම වියදම් දැරීම තුලින් ලබා ගත් භෞතික වත්කම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම හා ACA- 06 ආකෘතියේ එම වටිනාකම ඇතුලත් නොවීම හේතුවෙන් රු.12,283,680ක මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වටිනාකමෙහි නිරවද්‍යතාවය තහවුරු නොවීය.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

2024 වර්ෂයේ 154(6) විගණකාධිපති වාර්තාවේ 1.6.1 (අ) (iii) සඳහන් වූ පරිදි පරිගණක මුද්‍රිත SA 82 ආකෘතියෙහි මෘදුකාංග සංවර්ධනය සඳහා මිලදී ගැනීම් රු.91,680ක් වැඩියෙන් සටහන් වී තිබූ අතර, එය 2025 වර්ෂයේදී නිවැරදි කරන බවට ගණන් දීමේ නිලධාරී විසින් අදහස් දක්වා තිබුනද, 2025 වර්ෂයේ SA 82 ආකෘතිය අනුව අදාළ නිවැරදි කිරීම් සිදු කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ඇ)	2024 වර්ෂයේ 154(6) විගණකාධිපති වාර්තාවේ 1.6.1 (අ) (iii) සඳහන් වූ පරිදි පරිගණක මුද්‍රිත SA 82 ආකෘතියෙහි මෘදුකාංග සංවර්ධනය සඳහා මිලදී ගැනීම් රු.91,680ක් වැඩියෙන් සටහන් වී තිබූ අතර, එය 2025 වර්ෂයේදී නිවැරදි කරන බවට ගණන් දීමේ නිලධාරි විසින් අදහස් දක්වා තිබුනද, 2025 වර්ෂයේ SA 82 ආකෘතිය අනුව අදාළ නිවැරදි කිරීම් සිදු කර නොතිබුණි.	1.6.2

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් යටතේ වූ ගොඩනැගිලි හා ඉදිකිරීම් (208-02-03-2001) වැය විෂයය යටතේ ප්‍රතිපාදන රු.178,500,000කින් රු.736,320ක් වැයකර Metro Eye Digital Machine එකක් හා රු.1,497,000ක් වැයකර Visitor Chairs 100ක් මිලදී ගෙන එකතු වටිනාකම් වූ රු.2,233,320ක් මූලධන වත්කම් අත්පත් කර ගැනීමක් ලෙස මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (ACA – 06) ආරම්භක ශේෂයට එකතු කිරීම් ලෙස දක්වා තිබුණි.

(ආ) එක් මූලධන වැය විෂයයක් හා පුනරාවර්තන වැය විෂයයන් 17ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.83,050,000 ක් වූ අතර වියදම් රු.44,296,024ක් වූයෙන් ප්‍රතිපාදන ඉතිරිය රු.38,753,976ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට ප්‍රතිශතයක් ලෙස සියයට 20 සිට සියයට 64ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

(ඇ) එක් පුනරාවර්තන වැය විෂයයක් හා එක් මූලධන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදන එකතුව රු.4,150,000ක් වූ සමස්ත ප්‍රතිපාදනය ඉතිරි වී තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයය 5 කට අදාලව රු.44,700,000ක් වූ අයවැයගත ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම මත රු.11,550,000ක ප්‍රතිපාදන මු.රෙ 66 යටතේ මාරුකරගෙන තිබුණද එලෙස මාරු කර ගත් ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝජනය කර නොතිබූ අතර ප්‍රතිපාදන ඉතිරිවීම්, මාරු කර ගත් ප්‍රතිපාදනයෙන් සියයට 13 ත් සියයට 72 ත් අතර පරාසයක පැවතුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඡේද අංක 03 හා 04 අනුව බැඳීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි දෙපාර්තමේන්තුව විසින් CIGAS ගිණුම්කරණ පද්ධතිය දෛනිකව යාවත්කාලීන කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නිතිරීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

නීති, රීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 8.2	ආයතන සංග්‍රහය ප්‍රකාරව ඉන්වෙන්ට්‍රියක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ) 2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13.2 ඡේදයේ (අ), (ආ)	2023 වර්ෂයේ තක්සේරු වටිනාකම රු.2,200,000ක් වූ ජීප් රථයක් 2020 අප්‍රේල් 01 දින සිට ධාවනයෙන් ඉවත් කර තිබුණද චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කිරීමට පියවරගෙන නොතිබුණි.
(ඇ) 2024 මැයි 29 දිනැති 01/2024 අංක දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4(iii) වගන්තිය	2011 සිට 2022 දක්වා කාලසීමාව තුලදී සේවය අතහැර ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.507,025ක ණය ශේෂය සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2024 භාණ්ඩ වැඩ සහ උපදේශන නොවන සේවා සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය

(I) 8.7 – ii (අ)

රු.500,000 ඉක්මවනු ලබන වැඩ/සේවා කොන්ත්‍රාත් සඳහා විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවද, ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය ඉදිරිපිට පිහිටි රථගාලට පිවිසෙන ගේට්ටුව පුළුල් කොට සැකසීම හා තාප්පයේ නවීකරණ කටයුතු වෙනුවෙන් රු.2,574,434 ක් වැය වී තිබුණද මාර්ගෝපදේශයේ 8.7 ii (අ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹී නොතිබුණු අතර රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවට ගෙවීම් කිරීමට පෙර මාර්ගෝපදේශයේ 9.1 (ඇ) ඡේදය ප්‍රකාරව තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූලව අදාළ කාර්යය සිදුකර ඇති බවට සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(II) 9.1 (ඇ)

2025 අප්‍රේල් 03 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා විවිධ සැපයුම්කරුවන් 07 කුගෙන් ප්‍රසම්පාදනය කළ රු.6,988,133ක් වටිනා සපයන ලද ලී බඩු හා උපකරණ පිරිවිතර හා කොන්දේසි වලට අනුකූල වන බවට භාණ්ඩ භාර ගැනීම පිළිබඳ විෂය භාර නිලධාරී විසින් භාණ්ඩ භාර ගැනීම වෙනුවෙන් මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි සහතිකයක් නිකුත් කර නොතිබුණි.

(ඉ)	2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතෙහි 20 (2) (ඊ) වගන්තිය	බදු ඉන්වොයිස් පත්‍රයේ සැපයුම් වටිනාකම, අයකළ බද්ධ සහ සැපයුම් සඳහා ප්‍රතිෂ්ඨාව දක්වා තිබිය යුතු නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව විසින් 2025 නොවැම්බර් 27 දින ඉදිරිපත් කළ ඉන්වොයිස් පත්‍රයෙහි ලැබිය යුතු වටිනාකම ගණනය කිරීමේදී, වැට් බදු අගය සටහන් කර නොතිබුණද, රු.237,473ක වැට් බද්දක් ගෙවා තිබුණි.

3.4 තැන්පතු

2025 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ගිණුමෙහි ඇති රු.5,129,565ක වටිනාකමක් ඇති තැන්පතු 10ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

(අ) පුරාවිද්‍යාව, මානව වංශ විද්‍යාව, මානව විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව සහ භූ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළව පර්යේෂණ පැවැත්වීම දෙපාර්තමේන්තුවේ අරමුණ වූවද, 2021 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා මානව විද්‍යා විෂයය ක්ෂේත්‍රයට අදාළව කිසිදු පර්යේෂණයක් සිදු කර නොතිබුණි.

(ආ) ස්පොලියා සෙලනිකා පර්යේෂණ සංග්‍රහය 2012 වර්ෂයේ මුද්‍රණයෙන් පසු නැවත මුද්‍රණය කර ඇත්තේ 2021 වර්ෂයේදී වන බැවින් වසර 09 ක කාලසීමාවක් මෙම සංග්‍රහය මුද්‍රණය කිරීමේ දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටුවී නොතිබුණි.

4.1.2 සැලැසුම් කිරීම

(අ) 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අවස්ථා දෙකකදී සංශෝධනයට ලක්කර තිබූ අතර, පළමුවර සංශෝධනය 2025 සැප්තැම්බර් 13 දිනද, දෙවන වර සංශෝධනය වර්ෂය අවසන් වීමෙන් පසු 2026 පෙබරවාරි 18 දිනද අනුමැතිය සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2025 වර්ෂයේ ක්‍රියාකාරී

සැලැස්මේ දෙවන වර සංශෝධනය අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත්තේ කාර්යයන් ඉටු කර අවසන් වීමෙන් පසුව බව නිරීක්ෂණය විය.

(ආ) භාණ්ඩ, වැඩ සහ උපදේශන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහය - 2024 හි 4 වැනි පරිච්ඡේදයේ (අ) ඡේදය අනුව ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, ප්‍රසම්පාදන සැලසුම් කිරීම ආරම්භ කළ යුතු වුවද, 2025 වර්ෂය සඳහා අනුමත වූ ක්‍රියාකාරී සැලැස්ම 2025 සැප්තැම්බර් මස හා 2026 පෙබරවාරි මස සංශෝධනයට ලක්කර තිබුණද, 2025 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කර නොතිබුණි.

4.1.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) කොළඹ ජාතික කෞතුකාගාරයේ CCTV පද්ධතිය යටතේ කැමරා 156 ක් සවිකර තිබුණු අතර, එම කැමරා මඟින් පටිගත වූ දර්ශන නැවත නැරඹීමේ හැකියාව (Rewind පහසුකම) පූර්ව දින 30 කට පමණක් සීමා වී තිබුණි. කෞතුක වස්තූන් සඳහා සිදුවිය හැකි අනපේක්ෂිත හානිදායක සිදුවීම් හෙළිදරව් කර ගැනීමට පහසුවන ආකාරයට පටිගත කිරීම් සහ දත්ත ගබඩා කර ගැනීම සඳහා ප්‍රමාණවත් සංයුක්ත ගබඩා පහසුකම් ධාරිතාවය වර්ධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් වූ ව්‍යාපෘති 08 ක් සඳහා රු.76,450,000 ක් වැයකර තිබුණද, 2025 දෙසැම්බර් 31 දින වන විට වැඩ අවසන් කර නොතිබුණි.

4.1.4. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

2025 වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව ස්පොලියා සෙලනිකා නැමැති පර්යේෂණ සංග්‍රහය මුද්‍රණය කිරීමේ ප්‍රගතිය සියයට 100 ලෙස දක්වා තිබුනද, 2026 අප්‍රේල් 10 දින වන විටත් මුද්‍රණය කර දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබූ බැවින් 2025 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ලභා වී නොතිබුණි.

4.2 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ නරඹන්නන් වෙත නිකුත් කරනු ලබන ප්‍රවේශපත්‍ර ආදායම් බැංකුගත කිරීමේදී සිදුවී ඇති සේවක අක්‍රමිකතාව පිළිබඳ 2022 වර්ෂයේදී සිදු කරන ලද පරීක්ෂණය මත සහ මුදල් රෙගුලාසි 104(3) ප්‍රාරම්භක වාර්තාව අනුව දෙපාර්තමේන්තුවට අහිමි කර ඇති සමස්ථ ආදායම රු.1,652,605ක් විය. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි

104(4) යටතේ පූර්ණ වාර්තාවක් 2026 අප්‍රේල් 08 දින ඉදිරිපත් කර තිබුණි. මුදල් රෙගුලාසි 104 (4) අනුව හානිය දැන ගැනීමට ලැබුණු දින වන 2022 ඔක්තෝබර් 07 සිට මාස තුනක් ඇතුළත අවසාන වාර්තාව ලබාදිය යුතු වුවත්, එලෙස කටයුතු සිදුකර නොතිබුණි. ඉදිරිපත් කර තිබූ පූර්ණ වාර්තාව මත පදනම්ව මෙම අක්‍රමිකතාව සම්බන්ධයෙන් 2026 අප්‍රේල් 29 විගණිත දින වන විටත් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.3. කළමනාකරණ දුර්වලතා

භූ විද්‍යා අංශයේ පවතින සියලු කෞතුක භාණ්ඩ ඇතුලත් කර යාවත්කාලීන කරන ලද ලේඛනයක් පිළියෙල කර නොතිබූ අතර එම කෞතුක භාණ්ඩ සමීක්ෂණයකට ලක් කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2025 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 566 ක් වූවද, තත්‍ය කාර්ය මණ්ඩලය 380ක් ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 186 ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාවට විධායක මට්ටමේ තනතුරු 4ක්, තෘතියික මට්ටමේ තනතුරු 3ක්, ද්විතීයික මට්ටමේ තනතුරු 129ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 48ක් ඇතුලත් වේ. වසර 16 ක පමණ සිට ජාතික කෞතුකාගාරයේ අධි ශ්‍රේණියේ පුස්තකාලාධිපති තනතුරු 02 පුරප්පාඩුවී පැවතුණි.

කේ.එච්.යූ.ඩී.සරත් කුමාර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

(04). කාර්ය සාධන දර්ශක:

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව):

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% -74%
සංස්කෘතික හා ස්වභාවික උරුමයන් කළමනාකරණය	_	80%	-
සංස්කෘතික විවිධත්වය හා තිරසර සංවර්ධනය	_	85%	-
පරිපාලනය හා සංවර්ධනය	_	83%	-

(05). තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය:

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග:

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%- 49%	50%- 74%	75% - 100%
16. සෑම මට්ටමකම අදාළ ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතනයක් ගොඩනැගීම. (SGD 16)	16.1 අද්විතීය භාණ්ඩ එකතුවක් සඳහා කෞතුක භාණ්ඩ නිදර්ශක එකතුන් ශක්තිමත් කිරීම.	<u>මානව වංශ විද්‍යා අංශය</u> • අද්විතීය භාණ්ඩ එකතුව හඳුනා ගැනීම. • අදාළ කෞතුක භාණ්ඩය අයත් ශ්‍රේණිය නිර්ණය කිරීම සහ ඇගයීම් කිරීම. <u>මානව විද්‍යා අංශය</u> **භාණ්ඩ අත්පත්කර ගැනීම්** • ගෝනහම් ඇඳ - **2025.05.01** • බුසල - **2025.05.03** • බුසල් භාගය - **2025.05.02** • බීරළු කොට්ටය- **2025.17.01**			100% 100% 100%

		• කැලි පහේ විදුලි පන්දම - 2025.06.01 • යතු කැටය - 2025.06.02 • හැඩ කියත - 2025.07.01 • බුරුමය -2 025.07.02 • යතුරු කවුළු කටුව - 2025.07.01 • මුව අං තට්ටුව - 2025.08.01 • මුව අං කුට්ටම - 2025.08.02 • කරාබු පොට කපන තහඩු - 2025.09.01 • රන් කිරන තරාදිය - 2025.09.02 • විවිධ අඬු (I,II,III) - 2025.09.03 • කෝව (I,II) - 2025.09.04 • මුදු අඬුව - 2025.09.05 • පීර (I,II) - 2025.09.06 • පත් අඬුව - 2025.09.07 • සුද්ධ කරන තැටිය - 2025.09.18 • වාන් පතුල් ජෝඩුව - 2025.13.01 • ත්‍රිශූල - 2025.12.01 (1) • ත්‍රිශූල - 2025.12.01 (2) • තාලම්පට - 2025.12.02 • පන්හිඳ - 2025.12.03 • අබ සළඹ යුගල - 2025.12.4 (1) • අබ සළඹ යුගල - 2025.12.4 (2) • අත් වළලු යුගල - 2025.12.05 • ගිරය - 2025.12.06 • කොතලය - 2025.11.01 • සෙම්බුව - 2025.11.01 • තුප්පොට්ටි රෙද්ද - 2025.10.01 • ඇඹුල් අත්ත - 2025.10.02 • පන් කැති - 2025.10.03 (1) • පන් කැති - 2025.10.03 (2) • මිණි ගෙඩිය - 2025.10.04 • පිත්තල බුලත් වංගෙඩිය - 2025.10.05 • කුරුණි පෙට්ටිය - 2025.10.06			

		<u>උද්භිද විද්‍යා අංශය</u> • නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තු උද්‍යානයේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ලද වියළි නිදර්ශක 83 තෙත් නිදර්ශක 05 • හෝර්ටන්තැන්න සහ ඒ අවට පරිසර පද්ධතීන්වල සිදු කළ ක්ෂේත්‍ර චාරිකා මඟින් රැස් කළ නිදර්ශක 44 **<u>සත්ත්ව විද්‍යා අංශය</u>** (01). සම්පූර්ණ නිදර්ශක 05 ක් ලියාපදිංචිය සිදුකර ඇත. ඒවා පහත පරිදි වේ. • උරග නිදර්ශක 01 • මුහුදු බෙලි කවච 01 • මිරිදිය මත්ස්‍ය නිදර්ශක 02 • වවුලන් 01 **<u>කීට විද්‍යා අංශය</u>** • කීට විද්‍යා නිදර්ශක 129 ක් රැස් කිරීම **<u>භූ විද්‍යා අංශය</u>** • අම්පාර මහේස්ත්‍රාත් අධිකරණය ලබාදුන් ධුම තිරිවාන බණිජය අත්පත් කර ගැනීම හා ලියාපදිංචි කිරීම. **<u>ජාතික කෞතුකාගාර පුස්තකාලය</u>** • නීතිමය තැන්පතු වශයෙන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් ලැබුනු පොත් ප්‍රමාණය - 7694 • තැපැල් - 56 • පරිත්‍යාග - 17 • මිලදී ගැනීම් - 04			100% 100% 100% 100% 100% 100%

		<u>කොළඹ ජාතික කෞතුකාගාරය</u> නෙදර්ලන්තයෙන් ලැබුණු කෞතුක වස්තු 06 මහනුවර මැදිරියෙහි ප්‍රදර්ශනය සඳහා සැකසීම **<u>ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරය</u>** • චර්ම ශිල්පීය ක්‍රමය අනුව සකසා සංරක්ෂණය කරන ලද නැදුන්ගමුවේ විජය රාජා හස්තියාගේ අනුරුව වායුසමනය කරන ලද වීදුරු කුටියක් තුළ මහජන ප්‍රදර්ශනය සඳහා සැකසීම. **<u>මහනුවර ජාතික කෞතුකාගාරය</u>** • වසර 80 ක් පැරණි කිතුල් කෙන්දෙන් කළ තේඩාවක් අත්පත් කර ගන්නා ලදී.			90% 85% 100%
	16.2 අභ්‍යන්තර තත්ත්වයන්ට අනුව සංරක්ෂිත කෞතුක භාණ්ඩ/නිදර්ශක එකතුන් පවත්වාගෙන යාම.	**<u>මානව වංශ විද්‍යා අංශය</u>** • නිසි ප්‍රමිතීන්ට අනුව කෞතුක භාණ්ඩ ගබඩා කර තැබීම හා ඒවා ලේඛනගත කිරීම. **<u>මානව විද්‍යා අංශය</u>** • මානව විද්‍යා අංශයට අයත් කෞතුක භාණ්ඩ එකතුව පරීක්ෂා කර සංරක්ෂණය කළයුතු භාණ්ඩ 35ක් සංරක්ෂණය සිදු කිරීම හා සංරක්ෂණය කිරීමට පෙර සහ පසු ඡායාරූප ගැනීම • භාණ්ඩ 12ක් සංරක්ෂණය සඳහා භාරදී ඇත. **<u>උද්භිද විද්‍යා අංශය</u>** • නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තු උද්‍යානයේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ලද නිදර්ශක 83 වියළි සංරක්ෂිත ශාකාගාර පත්‍රිකා ලෙස සකස් කිරීම			100% 100% 100% 100%

		• නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තු උද්‍යානයේ සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවෙන් එක් රැස් කරන ලද නිදර්ශක 05ක් සංරක්ෂිත ක්‍රමවේදයන් යටතේ තෙත් නිදර්ශක ලෙස සකස් කිරීම			100%
		<u>සත්ත්ව විද්‍යා අංශය</u>			
		• නැඳුන්ගමුව විජයරාජා හස්තියගේ අනුරුව ප්‍රදර්ශනය සඳහා වීදුරු කුටීරය නිර්මාණය කිරීම.			100%
		• ලෙගී පක්ෂී නිදර්ශක 650 ක් සංරක්ෂණය කිරීම.			100%
		• උරග නිදර්ශක 322 ක් සංරක්ෂණය කිරීම.			100%
		• Holotype iy Paratype නිදර්ශක 407 සංරක්ෂණය කිරීම.			100%
		• ක්ෂීරපායී නිදර්ශක 264ක් සංරක්ෂණය කිරීම.			100%
		<u>කීට විද්‍යා අංශය</u>			
		• කීට විද්‍යා නිදර්ශක පෙට්ටි 250 ක් කපුරු යොදා සංරක්ෂණය කිරීම			100%
		• Orthoptera නිදර්ශක පෙට්ටි 1500 ක් සංරක්ෂණය කිරීම			100%
		<u>භූ විද්‍යා අංශය</u>			
		• භූ විද්‍යා ප්‍රදර්ශිත මැදිරියේ තැම්පත් ෆොසිලයක් සංරක්ෂණය කිරීමට පියවර ගැනීම	49%		
		<u>ජාතික කෞතුකාගාර පුස්තකාලය</u>			
		• ලේඛන සංරක්ෂණ කටයුතු සිදු කිරීම • පුස්තකාල ද්‍රව්‍ය ඩිජිටල්කරණය • විමර්ශන පුස්තකාලයක් සේ පවත්වාගෙන යාම			75%

		<u>සංරක්ෂණ අංශය</u> සංරක්ෂණ අංශය විසින් මේ වසරේදී පහත සඳහන් අංශවල සහ කෞතුකාගාරවල සංරක්ෂණය කරන ලද භාණ්ඩ පහත පරිදි වේ.			100%
		(01). **මානව වංශ විද්‍යා අංශය** • හිඳි බුද්ධ ප්‍රතිමා - 02 • සැරියුත් -මුගලන් දෙනම ප්‍රතිමා - 02 • ඉන්දීය සමරු කාසි - 05 • මස්ස කාසි - 10 • පිත්තල ලාම්පු - 03			100%
		(02). මානව විද්‍යා අංශය • නා රජු වෙස් මුහුණ • වක්කඩපල විදානේ වෙස් මුහුණ • තුනපහ කොටන වංගෙඩිය • ලී හැඳි ආන - 04 • කෘෂි උපකරණ - 10 • කෙණිසි - 05 • වෙල්ලිය • බෙහෙත් කිරන තරාදිය • රිරී යකා • බුම්මැඩිය • හුණු කිල්ලෝට - 10			100%
		(03). ජාතික කෞතුකාගාර පුස්තකාලය පහත සඳහන් පොත් සංරක්ෂණය කරන ලදී. • පුස්කොළ පොත් 02 • The Anandian Vol 3 • බාලප්‍රදීපය හෙවත් ළමයින්ට පහන Sketches of the Costumes of Ceylon • දරකැටි නිමිත්ත • පොත් කිහිපයක එකතුවක් • වෛද්‍ය ග්‍රන්ථ (පළමුවන කලාපය)			100%

		• වෛද්‍ය චිකිත්සාව • Weapons of Persuation • සිංහල විශුද්ධි මාර්ගය • Diary of Mr.John Doyle • සිංහල සඟරා හා පුවත්පත් පිළිබඳ නාමාවලිය • කඩතවිතරණි පිටපත • කළුකොදයායේ පඤ්ඤාසේකර නාමාවලිය • OLD/MP/37/190 පොත • Vol 23 පොත • මුද්දර පොත • Ananda College Journal 1915 – 1920 • Fisheries Research Station			
		(04). කොළඹ ජාතික කෞතුකාගාරය			
		• සිතුවම් මැදිරියේ සිතුවම් පිරිසිදු කිරීම			100%
		• ගල් කැටයම් මැදිරියේ කොරිඩෝවේ ඇති ගල් කුළුණේ ඇල්ගී ඉවත් කිරීම			100%
		• නෙදර්ලන්ත කෞතුක භාණ්ඩ එකතුවේ විශාල තුවක්කු සංරක්ෂණය කිරීම.			100%
		• ඇත්දළ භාණ්ඩ 16ක් සංරක්ෂණය කිරීම.			100%
		• නෙදර්ලන්ත කෞතුක භාණ්ඩ එකතුවේ රිදී කස්ථාන කඩුව සංරක්ෂණය කිරීම.			100%
		• මහනුවර මැදිරියේ සිංහාසනය ඇතුළු රාජකීය භාණ්ඩ එකතුව සංරක්ෂණය කිරීම.			100%
		• දොර උළුවහු 15ක් සංරක්ෂණය කිරීම.			100%
		• නෙදර්ලන්ත කෞතුක භාණ්ඩ එකතුවේ ලෙව්කේ තුවක්කුව (තුවක්කු බඳ) සංරක්ෂණය කිරීම			100%
		• මහනුවර මැදිරියේ රාජකීය පෙට්ටගම හා රාජකීය පුටුව සංරක්ෂණය කිරීම			100%

		• සිතුවම් මැදිරියේ වියන් සිත්තම හා අප්සරාවකගේ අත යන සිතුවම් සංරක්ෂණය කිරීම			100%
		• දැව භාණ්ඩ මැදිරියේ පුටුවක් සංරක්ෂණය කිරීම			100%
		• විශාල තුවක්කු තබා ඇති ප්‍රදර්ශන අල්මාරිය තුළ සාපේක්ෂ ආර්ද්‍රතාවය මැනීම			100%
		(05). ප්‍රාදේශීය කෞතුකාගාර			
		• ගාල්ල ජාතික කෞතුකාගාරයේ මැටි කළයක් සංරක්ෂණය කිරීම			100%
		• ගාල්ල ජාතික කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ 46 ක පුස් ඉවත් කිරීම			100%
		• ගාල්ල ජාතික කෞතුකාගාරයේ යක්ෂ බලි රූපයක දළ දෙක සකස් කිරීම			100%
		• ඕලන්ද කෞතුකාගාරයේ භාණ්ඩ සංරක්ෂණ කටයුතු සිදු කිරීම			100%
		• ඕලන්ද කෞතුකාගාරයේ පිත්තල පහනක් සංරක්ෂණය කිරීම			100%
		• ඕලන්ද කෞතුකාගාරයේ කඩු කිහිපයක් සංරක්ෂණය කිරීම			100%
		• නිදහස් කෞතුකාගාරයේ පුස්කොළ පොත් 02ක් සංරක්ෂණය කිරීම			100%
		• අනුරාධපුර ජන කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩවල තත්ත්ව පරීක්ෂාවක් සිදු කිරීම			100%
		(05). පොත් බැඳීම්			
		• පොත් බැඳීම් 189ක් සිදු කිරීම. (Hard binding) ඇතුළුව			100%

		(06). වෙනත්			
		• අම්බලංගොඩ කලාගුරු ටුක්කාවඩු ගුණදාස කෝලම් නාට්‍ය සංසදයේ කෝලම් නාට්‍ය සඳහා භාවිත කරන ලද ඉපැරණි වස්ත්‍රාභරණ ගබඩා කිරීම පිළිබඳව උපදෙස් ලබාදීම			100%
		• අම්බලංගොඩ වෙස්මුහුණු කෞතුකාගාරයෙහි වෙස් මුහුණු 06ක් සංරක්ෂණය කිරීම			100%
		• නෙදර්ලන්තයේ Rijks Museum සමග එක්ව කොළඹ ජාතික කෞතුකාගාරයේදී දැව හා ලෝහ සංරක්ෂණය පිළිබඳ දින 05 ක පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.			100%
